# ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලද වර්ධන පනත

[සහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 21 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

(1972 ඔක්තෝබර් මස 6 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය.

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන**
**කෘෂිකාර්මික පලදා වර්ධන පනත**

**[සහතිකය සටහන් කළේ 1972 සැප්තැම්බර් මස 21 වන දින.]**

එල්. ඩී.—ඕ. 94/71.

**කෘෂිකාර්මික ඉඩම්වලින් නිසි ප්‍රයෝජනය ගැනීමත් ඒවායේ කාර්ය සංවිධානය නිසි පරිදි කිරීමත් කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත පිළිබඳ කාර්යක්ෂම කාර්ය සංවිධානයක් ඇති කිරීමත් මගින් උපරිම පලදා වර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද කෘෂිකාර්මික විනිශ්චය අධිකාර පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**කෙටි නාමය**

**1.** මෙම පනත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 2 දරන කෘෂිකාර්මික පලදා වර්ධන පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

### කෘෂිකාර්මික ඉඩම්වල ගොවිතැන් කිරීම සහ එම ඉඩම් පිළිබඳ කාර්ය සංවිධානය

**කෘෂිකාර්මික ඉඩම්වල ගොවිතැන් කිරීමට සහ කාර්ය සංවිධානයට අදාළව අයිතිකරුවන් හෝ පරිහරණය කරන්නන් සතු යුතුකම්**

2. (1) යම් කෘෂිකාර්මික ඉඩමක ප්‍රමාණය, පිහිටීම සහ ස්වාභාවික සම්පත් සැලකිල්ලට ගෙන ඒ ඉඩමට ඉතාම ගැලපෙන බෝග වර්ග එහි ගොවිතැන් කිරීම හෝ සත්ව වර්ග ඇති කිරීම සහ මේ පනත මගින් මෙහි මින් මතු සලස්වා ඇති හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර මනා කාර්ය සංවිධානය පිළිබඳ ඊතිවලට අනුකූලව නිෂ්පාදනවල තත්ත්වය හා ප්‍රමාණය යන දෙ අංශයෙන් ම පලදාව දියුණු කිරීමේ සහ නිෂ්පාදනය විෂයෙහි කාර්යක්ෂම සම්මත තත්ත්වයක් පවත්වා ගෙන යාමේ අරමුණ ඇතිව ඒ ඉඩම පිළිබඳ කාර්ය සංවිධානය කිරීම, එවැනි යම් කෘෂිකාර්මික ඉඩමක සෑම අයිතිකරුවකුගේ ම හෝ පරිහරණය කරන්නකුගේ ම යුතුකම විය යුතු ය.

(2) අයිතිකරු එවැනි කෘෂිකාර්මික ඉඩමක් පරිහරණය නො කරන සහ අයිතිකරු සමග ඇති කර ගත් විධිමත් හෝ අවිධිමත් ගිවිසුමක් අනුව පරිහරණය කරන්නා එහි සන්තකය දරන අවස්ථාවක, යම් ගිවිසුමක ප්‍රකාශිතව ම යම් පටහැනි විධිවිධානයක් අඩංගු වී තිබුණ හොත් මිස, ඒ ඉඩමේ ගොවිතැන් කිරීමට සහ නිෂ්පාදනය

1—ජේ 13933—20,950 (72/10)

පිළිබඳ කාර්යක්ෂම සම්මත තත්ත්වයක් පවත්වා ගෙන යාමට පරිහරණය කරන්නාට හැකි වනු පිණිස අවශ්‍ය ප්‍රධාන වැඩ සහ උපකරණ සැපයීම අයිතිකරුගේ යුතුකම විය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කෘෂිකාර්මික ඉඩමක් සත්තකව සිටින පරිහරණය කරන්නා මනා කාර්ය සංවිධානය පිළිබඳ රීතිවලට අනුකූලව ඒ ඉඩමේ ගොවිතැන් කරන්නේ ද සහ එහි කාර්ය සංවිධානය කරන්නේ ද යන්න නිශ්චය කිරීමේ දී, කාර්යක්ෂම නිෂ්පාදනය සඳහා අවශ්‍ය සංවර්ධනය කිරීම් සැපයීම සහ ප්‍රධාන වැඩ සහ උපකරණ නඩත්තු කිරීම අයිතිකරු විසින් කරනු ලැබ ඇත්තේ යම් ප්‍රමාණයක ද ඒ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(4) අන් තැනැත්තකු විසින් පරිහරණය කරනු ලබන යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු වෙත මනා කාර්ය සංවිධානය පිළිබඳ රීති යටතේ පැවරී ඇති වගකීම්වලට, ප්‍රධාන වැඩ සහ සවිකළ උපකරණ නඩත්තු කිරීමට අදාළ ව, යම් ගිවිසුමක් ප්‍රකාර කරනු ලැබීමට ඒ අන් තැනැත්තා බැඳී සිටින බැඳීමක් ඇතුළත් නොවිය යුතු ය.

මනා කාර්ය සංවිධානයේ ප්‍රමිති.

3. (1) 2 වන වගන්තියේ විධිවිධානවල සාමාන්‍යත්වයට හානියක් නොවන පරිදි, යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින්, මෙම පනතේ හෝ ඒ යටතේ පනවනු ලැබූ නියෝග යටතේ නිශ්චිතව සඳහන් පරිදි—

(අ) තම කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් වූ සියලු යුතුකම් සහ බැඳීම් ඉටු කළ යුතු ය ; තව ද

(ආ) තම ඉඩම පිහිටා ඇති කෘෂිකාර්මික ඉඩම් ප්‍රදේශයේ, යායේ හෝ බිම් කට්ටි සමූහයේ පලදා වර්ධනය පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් වූ සියලු බැඳීම් ඉටු කළ යුතු ය.

(2) යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින්, අමාත්‍යවරයා විසින් සිය අභිමතය පරිදි නිශ්චය කරනු ලැබිය හැකි සෙසු යුතුකම්වලට අමතරව—

(අ) නිර්දේශ කරනු ලැබූ බෝග ජාති හා වර්ග පමණක් වගා කිරීමට සහ සතුන් වර්ග පමණක් ඇති කිරීමට ;

(ආ) ඒ කෘෂිකාර්මික ඉඩම පිරිසිදුවත් මනා තත්ත්වයක වගාවකින් හා සාරවත් භාවයකින් යුක්තවත් දිය බැස යාම පිළිබඳ නිසි ක්‍රමයක් ඇතුළුව මනා තත්ත්වයකින් යුක්තවත් පවතින ආකාරයට එම ඉඩමේ බෝග වැවීමට ;

(ඇ) වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස යෙදීමට ;

(ඈ) පස සහ ජලය උපරිම අන්දමින් ආරක්ෂා වීම සහතික වන ආකාරයට ඉඩම යථා පරිදි නඩත්තු කිරීමට ;

(ඉ) රසායන පෝර හෝ වෙනත් පෝර වර්ග සෑහෙන ප්‍රමාණවලින් යෙදීමෙන් පසෙහි සාරවත් භාවය දියුණු කිරීමට සහ පවත්වා ගැනීමට ;

(ඊ) භාර ගෙන ඇති කෘෂිකාර්මික කාර්යයේ මාදිලියට අනුකූලව, බෝග වගා කිරීමෙහි හෝ සතුන් ඇති කිරීමෙහි ලා කාර්යක්ෂම කාර්ය සංවිධානමය සම්මත තත්ත්වයක් පවත්වා ගෙන යාමට ;

(උ) බෝග සහ සතුන් රෝගවලින් තොරව සහ කෘමීන් හා සෙසු පළිබෝධක ගහන වීමෙන් තොරව ආරක්ෂා කිරීමට සහ පවත්වා ගෙන යාමට අවශ්‍ය පියවර ගැනීමට ;

(ඌ) වැඩෙන අවස්ථාවේ පවතින බෝග සහ නෙලා ගනු ලැබූ බෝග හෝ නෙලා ගනු ලබමින් පවත්නා බෝග ආරක්ෂා කිරීම සහ පරිරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ;

(එ) වෙළඳ පොළට යැවීම සඳහා නිෂ්පාදන සකස් කිරීමේ දී නිෂ්පාදනවල ප්‍රමාණය හෝ තත්ත්වය පිළිබඳව සිදුවිය හැකි හානිය හැකිතාක් අඩු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ; සහ

(ඒ) අවශ්‍ය කවර විට දී වුව ද නඩත්තු කිරීමේ සහ අලුත්වැඩියා කිරීමේ කටයුතු කිරීමට

වග බලා ගත යුතු ය.

(3) යම් කෘෂිකාර්මික ඉඩමක අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින්, නියමිත යම් ප්‍රදේශයකට, යායකට හෝ කෘෂිකාර්මික බිම් කට්ටි සමූහයකට අයත් ඉඩම් පිළිබඳ පොදු කාර්ය සංවිධානමය අවශ්‍යතා හේතුකොට ගෙන උද්ගත විය හැකි සිය යුතුකම් සහ බැඳීම් සියල්ල යථා පරිදි ඉටු කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු ය. එම යුතුකම්වලට පහත සඳහන් කරුණු අතුරෙන් යම් කරුණක් හෝ ඒ සියල්ල ඇතුළත් විය හැකි ය :—

(අ) කෘෂිකාර්මික කාර්යයන් ඒවා පිළිබඳ නිසි වකවානුවලට යොදා ගැනීම ;

(ආ) වාරිමාර්ග ජලය කාර්යක්ෂම ලෙස යෙදීම ;

(ඇ) පස සංරක්ෂණය කිරීම සඳහා හවුලේ කටයුතු යෙදීම ;

(ඈ) ජලය සංරක්ෂණය කිරීම සහ දිය බැස යාමට සැලැස්වීම ;

(ඉ) පළිබෝධකවලින් සහ රෝගවලින් ආරක්ෂා කිරීම ;

(ඊ) ඉඩම්වලින් කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනය ගැනීම සහ කෘෂිකාර්මික පලදා වර්ධනය සැලැස්වීම සඳහා මේ පනත යටතේ නියෝග මගින් පනවනු ලැබිය හැකි අන් කිසි සාමූහික වගකීම් ; සහ

(උ) යම් කෘෂිකාර්මික පලදාවක් නෙලා ගැනීමත් එය අලෙවි කිරීමත් අතර නියමිත කාලසීමාව අනුගමනය කිරීම ගැන වගබලා ගැනීම.

2 වන හා 3 වන වගන්තිවල විධිවිධාන ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම වරදක් විය යුතු බව.

4. මේ කොටසෙහි 2 වන හා 3 වන වගන්ති මගින් තමා වෙත පවරනු ලැබූ වගකීම් ඉටු කිරීම පැහැර හරින අයිතිකරුවකු හෝ පරිහරණය කරන්නකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා අයිතිකරු බැඳී සිටින විට, ඒ අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා ඉඩම පරිහරණය කරන්නා බැඳී නොසිටිය යුතු බව.

5. තමාට අයිති නොවන කෘෂිකාර්මික ඉඩමක පරිහරණය කරන්නකු වෙත, මේ කොටසෙහි විධිවිධාන යටතේ පැවරී ඇති වගකීම් වලට, ඒ ඉඩමෙහි හෝ එහි යම් කොටසක අයිතිකරු විසින් කිරීමට බැඳී සිටින නඩත්තු කිරීමේ හෝ අලුත්වැඩියා කිරීමේ යම් වැඩක් කිරීමේ බැඳීමක් ඇතුළත් නොවිය යුතු ය.

අනුපාලන ආඥා.

6. (1) 2 වන වගන්තියෙහි හෝ 3 වන වගන්තියෙහි හෝ මේ පනත යටතේ පනවනු ලැබූ යම් නියෝගවල විධිවිධාන අනුව යම් කෘෂිකාර්මික ඉඩමක ගොවිතැන් නොකරනු ලබන බවට, නැතහොත් එකී විධිවිධාන අනුව ඒ ඉඩමෙහි කාර්ය සංවිධානය කිරීම පිළිබඳ තම වගකීම් ඒ ඉඩමෙහි අයිතිකරු හෝ පරිහරණය කරන්නා ඉටු නොකරන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, තමා වෙත හෝ තමාගේ බලය ලත් නියෝජිතයා වෙත කරුණු සැලකර සිටීමේ අවස්ථාවක් ඒ කෘෂිකාර්මික ඉඩමෙහි අයිතිකරුට හෝ පරිහරණය කරන්නාට දීමෙන් පසු, (මෙහි මින් මතු "අනුපාලන ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආඥාවක් මගින් අවස්ථාවෝචිත පරිදි ඉඩමෙහි කාර්ය සංවිධානයට අදාළ වන පමණට ඉඩමේ අයිතිකරු අමාත්‍යවරයාගේ අනුපාලනය යටතේ තැබීම හෝ ඉඩමෙහි ගොවිතැන් කිරීමට අදාළ වන පමණට ඉඩම පරිහරණය කරන්නා අමාත්‍යවරයාගේ අනුපාලනය යටතේ තැබීම කළ හැකි ය.

(2) සෑම අනුපාලන ආඥාවක් ම එය අදාළ වන තැනැත්තා වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු අතර, ඒ කෘෂිකාර්මික ඉඩම පිහිටා ඇති ප්‍රදේශයෙහි කෘෂිකාර්මික පලදු වර්ධන කමිටුව වෙත ඒ ආඥාවෙහි පිටපතක් යැවිය යුතු ය. ඒ ආඥාවෙහි එක් පිටපතක් අවසාන වශයෙන් දන්නා ඒ තැනැත්තාගේ ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවනු ලැබුව හොත් සහ එහි පිටපතක් ඒ ඉඩමෙහි හෝ එය මත ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබුව හොත් ඒ ආඥාව ඒ තැනැත්තා වෙත භාර දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය:

එසේ වුව ද ඒ ඉඩමෙහි අයිතිකරුවන් හෝ පරිහරණය කරන්නන් කිප දෙනකු සිටින සහ ඒ අයිතිකරුවන්ගේ සහ පරිහරණය කරන්නන්ගේ ලිපිනයන් දැන ගත නොහැකි අවස්ථාවක, ඒ ඉඩමෙහි හෝ එය මත ප්‍රකට ස්ථානයක ඒ ආඥාව ප්‍රදර්ශනය කිරීම ඒ ඉඩමෙහි අයිතිකරුවන් හා පරිහරණය කරන්නන් සියල්ලන් ම වෙත ආඥාව භාර දෙනු ලැබීමක් ලෙස සැලකිය යුතු ය.

(3) අනුපාලන ආඥාවක් වලංගුව පවතිද්දී අමාත්‍යවරයා විසින් ඒ සඳහා බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින්—

(අ) අවස්ථාවෝචිත පරිදි ඒ ඉඩමෙහි කාර්ය සංවිධානය කරනු ලබන හෝ එහි ගොවිතැන් කරනු ලබන ආකාරය පරීක්ෂා කිරීමේ සහ නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා ආඥාව අදාළ වන ඉඩමට සියලු සාධාරණ වේලාවන්හි දී ඇතුළු වීම ද;

(ආ) මේ පනතෙහි හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් මගින් නියම කරනු ලබන පරිදි මනා කාර්ය සංවිධාන හා ගොවිතැන් කිරීමේ සම්මත තත්ත්වයන් අනුව ප්‍රස්තුත ඉඩමේ අයිතිකරු හෝ පරිහරණය කරන්නා ක්‍රියා කර ගෙන යන බවට වග බලා ගැනීම සඳහා ලිඛිත දැන්වීමකින් යම් විධානයක් නිකුත් කිරීම ද කළ හැකි ය.

(4) මේ පනතෙහි හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝග මගින් නියම කර ඇති මනා කාර්ය සංවිධාන හා ගොවිතැන් කිරීමේ සම්මත තත්ත්වයන් අනුව කෘෂිකාර්මික ඉඩමෙහි අයිතිකරු හෝ පරිහරණය කරන්නා ක්‍රියා කර ගෙන යන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වුවහොත් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ අනුපාලන ආඥාවක් අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීමට පෙර දෙනු ලැබූ යම් විධානයක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඒ ආඥාව ප්‍රත්‍යාදිෂ්ට කිරීම බල නොපෑ යුතු ය.

(5) අනුපාලන ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ දැන්වීම, අනුපාලන ආඥාව භාර දෙනු ලැබූ ආකාරයෙන් ම ඒ තැනැත්තා වෙත භාර දෙනු ලැබිය යුතු අතර ඒ දැන්වීමෙහි පිටපතක් එම ප්‍රදේශයේ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව වෙත ද යැවිය යුතු ය.

(6) (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ දෙනු ලැබූ යම් විධානයක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින, නැතහොත් ඒ උපවගන්තියෙහි (අ) ඡේදයෙන් යම් බලය ලත් තැනැත්තකු වෙත පවරනු ලැබූ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ තැනැත්තාට බාධා පමුණුවන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

7. (1) අනුපාලන ආඥාවක් මාස දොළහක කාල සීමාවක් බල පැවැත්වූ පසු, 6 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බලයලත් තැනැත්තකු විසින් කරනු ලැබූ වාර්තාවක් අනුව, එකී උපවගන්තිය යටතේ යම් විධානයක් කරන ලද්දේ වුව ද සතුටු දායක දියුණුවක් පෙන්නුම් කර නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත්වූ අවස්ථාවක, අහිමි කිරීමේ ආඥාවක් කළ හැකි ය. අහිමි කිරීමේ ආඥා.

(2) 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන අහිමි කිරීමේ ආඥාව භාරදීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) යම් ඉඩමක් සම්බන්ධයෙන් අහිමි කිරීමේ ආඥාවක් කරනු ලැබුවහොත් ඒ ඉඩම ඒ ආඥාවේ දින සිට ආණ්ඩුව වෙත සතු විය යුතු ය:

එසේ වුව ද ඉඩම පරිහරණය කරන්නා එහි අයිතිකරු නොවන අවස්ථාවක ඉඩම එසේ සතු නොවිය යුතු නමුත් ඒ ඉඩම පිහිටා ඇති ප්‍රදේශය භාර කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ නිර්දේශය අනුව ඒ ඉඩම යෝග්‍ය තැනැත්තකුට බදු දෙනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකුට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ අහිමි කිරීමේ ආඥාවක් කරනු ලැබුවේ ද, ඒ තැනැත්තා විසින් ඒ ආඥාව ලැබී දින දහහතරක් ඇතුළත ඒ ආඥාව කිරීමට විරුද්ධව ලිඛිත ආයාචනයක් කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කළ හැකි ය.

අහිමි කිරීමේ ආඥාවේ සඳහන් ඉඩමෙන් පිටවී යාම.

8. අහිමි කිරීමේ ආඥාවක් නිකුත් කර භාර දෙනු ලැබූ විට ඒ ආඥාව භාර දෙනු ලැබූ තැනැත්තා විසින් ආඥාවේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත ආඥාවේ සඳහන් ඉඩමෙන් පිටවී යා යුතු ය.

ඉඩමෙන් පිටවී යාම පැහැර හරින තැනැත්තන් ඉවත් කිරීම.

9. අහිමි කිරීමේ ආඥාවක් භාර දෙනු ලැබූ තැනැත්තකු ආඥාවේ නිශ්චිතව සඳහන් කාලසීමාව ඇතුළත ඉඩමෙන් පිටවී යාම පැහැර හරින අවස්ථාවක, අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ තැනැත්තකුට, ඉඩම පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය ඇති අධිකරණය වෙත ඉල්ලුම් කළ විට ඒ ඉඩම පරිහරණය කරන තැනැත්තා වහාම ඉවත් කිරීමට පිස්කල්ට විධාන කෙරෙන අධිකරණ ආඥාවක් ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් වෙනුවෙන් වන්දි හිමිකම් පෑම්.

10. අහිමි කිරීමේ ආඥාවක් බලපාන්නේ යම් අයිතිකරුවකුගේ හෝ පරිහරණය කරන්නකුගේ අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාවය කෙරෙහි ද ඒ අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින්, ඒ අහිමි කිරීමේ ආඥාව භාර දෙනු ලැබූ දිනයෙහි සිට එක් මාසයක කාල සීමාවක් ඇතුළත වන්දි සඳහා වූ ලිඛිත හිමිකම් පෑමක් අමාත්‍යවරයා විසින් බලය පවරනු ලැබූ (මෙහි මින් මතු "බලය ලත් නිලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නිලධරයකුට ඉදිරිපත් කළ යුතු ය. ඒ හිමිකම් පෑමෙහි පහත දක්වෙන කරුණු නිශ්චිතව සඳහන් විය යුතු ය.

(අ) තමාගේ නම සහ ලිපිනය ;
(ආ) ඒ ඉඩමේ තමාට ඇති සම්බන්ධතාවයේ ස්වභාවය ;
(ඇ) තමාගේ හිමිකම් පෑම පිළිබඳ විස්තර ; සහ
(ඈ) වන්දියෙන් තමා හිමිකම් පාන්නේ කොපමණ ප්‍රමාණයකට ද යන වග.

වන්දිය නිශ්චය කිරීම.

11. (1) යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් 10 වන වගන්තිය යටතේ කරන ලද හිමිකම් පෑමක් ලැබුණු පසු හැකිතාක් ඉක්මණින් බලය ලත් නිලධරයා විසින් එම ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීමේ කාර්යය ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කළ යුතු ය.

(2) ආණ්ඩුව වෙත සතුවූ යම් කෘෂිකාර්මික ඉඩමක් සඳහා වූ වන්දියට හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳ යම් ආරාවුලක් ඇති අවස්ථාවක බලය ලත් නිලධරයකු විසින්, එම ඉඩම වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීමේ කාර්යය ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කිරීම කල් තබා එම ආරාවුල තීරණය කිරීම සඳහා සිවිල් අධිකරණ බලය ඇති නිසි අධිකරණයක් වෙත යොමු කළ යුතු ය. අධිකරණය විසින් එම ආරාවුල සම්බන්ධයෙන් එහි තීරණය දුන් පසු ඒ හිමිකම් පෑම ප්‍රධාන තක්සේරුකරු වෙත යොමු කළ යුතු ය.

(3) ආණ්ඩුව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් වෙනුවෙන් වූ වන්දියට හිමිකම් පාන සියල්ලන්ට ම පුද්ගලිකව හෝ ඔවුන් විසින් ඒ සඳහා බලය පවරනු ලබන නියෝජිතයන් මගින් ඒ ඉඩමෙහි වටිනාකම පිළිබඳව තමා ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් කිරීමට අවස්ථාවක් දී ප්‍රධාන තක්සේරුකරු විසින් ඒ ඉඩම සඳහා ගෙවිය යුතු වන්දිය පිළිබඳ නිශ්චයක් කළ යුතු ය.

**12.** ප්‍රධාන තක්සේරුකරුගේ නිශ්චය ලැබුණු විට, බලය ලත් නිලධරයා විසින්, ඒ නිශ්චයට විෂය වූ කෘෂිකාර්මික ඉඩම සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල පිළිබඳව තීන්දුවක් දිය යුතු අතර ඒ වන්දියට හිමිකම් ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට ඒ තීන්දුව දැනුම් දිය යුතු ය.

බලය ලත් නිලධරයා වන්දියෙහි මුදල පිළිබඳ තීන්දුවක් දිය යුතු බව.

**13.** (1) ආණ්ඩුව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වෙනුවෙන් වූ යම් හිමිකම් පෑමක් ඒ ඉඩමේ කලින් අයිතිකරු නොවන යම් තැනැත්තකුගෙන් නොලැබුණු අවස්ථාවක, බලය ලත් නිලධරයා විසින් ඒ වන්දිය ඒ කලින් අයිතිකරුට ගෙවීමට සැලැස්විය යුතු ය.

වන්දි ගෙවීම.

(2) ආණ්ඩුව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වෙනුවෙන් වූ යම් හිමිකම් පෑමක් ඒ ඉඩමේ කලින් අයිතිකරු නොවන යම් තැනැත්තකුගෙන් ලැබුණු අවස්ථාවක, වන්දි හිමි තැනැත්තන් පිළිබඳව ද ඔවුන් අතර වන්දිය කොටස් කර ගැනීම පිළිබඳව ද ඒ සෑම හිමිකම් පාන්නකු සහ කලින් අයිතිකරු සමාදානයෙන් ලියවිල්ලකින් එකඟත්වයකට පත්වුවහොත්, ඒ එකඟවීම අනුව ඒ තැනැත්තන්ට ඒ වන්දිය කොටස් කර ගෙවීමට බලය ලත් නිලධරයා විසින් සැලැස්විය යුතු ය. එබඳු කිසිම එකඟවීමක් ඇති නො වී නම් ඒ වන්දිය එය හිමි තැනැත්තන් විසින් ලබා ගැනීම පිණිස සිවිල් අධිකරණ බලය ඇති යම්කිසි නිසි අධිකරණයකට ගෙවීමට බලය ලත් නිලධරයා විසින් සැලැස්විය යුතු ය.

**14.** මේ පනත යටතේ යම් තැනැත්තකුට ගෙවිය යුතු යම් වන්දියක් ඔහු වෙත ඉදිරිපත් කරනු ලැබූ විට ඔහු විසින් එය නො පිළිගන්නා ලද අවස්ථාවක හෝ ඒ තැනැත්තා මිය ගොස් ඇති හෝ අභව්‍ය හෝ ඔහු ගැන දැන ගන්නට නොමැති අවස්ථාවක, ඒ වන්දිය හිමි තැනැත්තා හෝ තැනැත්තන් විසින් ලබා ගැනීම සඳහා සිවිල් අධිකරණ බලය ඇති යම් නිසි අධිකරණයකට ගෙවිය යුතු ය.

වන්දි නොපිළිගන්නා අවස්ථා ආදිය සඳහා විධිවිධාන.

වන්දියෙන් මුදල් අඩුකර ගැනීම.

**15.** (1) මේ පනත යටතේ ආණ්ඩුව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට වන්දි ලැබීමට හිමිකම් ඇති අවස්ථාවක, ඒ වන්දි මුදලින් අඩුකර ගැනීමට හෝ නවතා ගැනීමට මේ පනත යටතේ බලය පැවරුණු හෝ නියමිත මුදල් බලය ලත් නිලධරයා විසින් ඒ වන්දි මුදලින් එසේ අඩුකර ගැනීම හෝ නවතා ගැනීම කළ යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යයන් සඳහා "වන්දිය" යන යෙදුමට ඒ වන්දියට අයත් වී අය විය යුතු යම් පොලියක් ද ඇතුළත් වේ.

වන්දිය අයත් වී අය විය යුතු අවස්ථාව.

**16.** මේ පනත යටතේ ආණ්ඩුව වෙත සතු වූ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය එම ඉඩම එසේ සතු වූ දිනයෙහි සිට අයත් වී අය විය යුතු ලෙස සැලකිය යුතු ය.

තීන්දු කරන ලද වන්දි මුදල ගැන අතෘප්තියට පත් තැනැත්තන් විසින් ඊට විරුද්ධව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සංස්ථාපිත සමාලෝචන මණ්ඩලය වෙත ආයාචනා කළ හැකි බව.

**17.** (1) 12 වන වගන්තිය යටතේ තමාට තීන්දු කරන ලද වන්දි මුදල ගැන යම් තැනැත්තකු අතෘප්තියට පත් වූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ තීන්දුවට විරුද්ධව, ආයාචනය පිළිගැනීමට ඇසීමට සහ තීරණය කිරීමට මෙයින් බලය පවරනු ලබන (මෙහි මින් මතු "සමාලෝචන මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ සංස්ථාපිත සමාලෝචන මණ්ඩලය වෙත ආයාචනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ආයාචනයක් ලියවිල්ලකින් විය යුතු ය; තව ද එය සමාලෝචන මණ්ඩලයේ සභාපති නමට විය යුතු අතර මණ්ඩලයේ කාර්යාලයට යැවිය යුතු ය; නැතහොත් එහි දී භාරදිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ආයාචනයක—

(අ) ආයාචකගේ නම සහ ලිපිනය ප්‍රකාශ විය යුතු ය;

(ආ) ආයාචනය ඉදිරිපත් කරනු ලැබීමට හේතු වූ තීන්දුව දුන් බලය ලත් නිලධරයා එහි වගඋත්තරකරු වශයෙන් සඳහන් කළ යුතු ය;

(ඇ) තීන්දුව කරන ලද්දේ යම් කෘෂිකාර්මික ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ ඉඩමෙහි විස්තර පිළිබඳ සංක්ෂිප්ත ප්‍රකාශයක් ඇතුළත් විය යුතු ය; තව ද

(ඈ) ආයාචක හිමිකම් දක්වන වන්දි මුදල සහ වගඋත්තරකරු විසින් තීන්දු කරන ලද මුදල නොසෑහේ යයි සැලකීමට ඔහුට ඇති හේතු, ප්‍රකාශ විය යුතු ය.

(4) මේ පනතේ 12 වන වගන්තිය යටතේ වන්දිය පිළිබඳ දැනුම්දීම ඉල්ලුම්කරු විසින් ලැබූ දිනයෙන් පසු දින විසි එකක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබී නම් මිස, (1) වන උපවගන්තිය යටතේ වූ කිසිම ආයාචනයක් සමාලෝචන මණ්ඩලය විසින් නො පිළිගත යුතු ය.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ ඇතැම් වගන්ති මේ පනත යටතේ සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ආයාචනා සම්බන්ධයෙන් අදාළ කිරීම.

**18.** (1) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 24 වන වගන්තියේ විධිවිධාන මේ පනත යටතේ සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන යම් ආයාචනයක දී ඒ මණ්ඩලය ඉදිරිපිට පැවැත්වෙන නීති කෘත්‍යවලට අදාළ විය යුතු ය.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 25 වන වගන්තියේ විධිවිධාන මේ පනත යටතේ සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන යම් ආයාචනයක දී කරනු ලබන ඒ මණ්ඩලයේ තීරණ යට, පහත සඳහන් වෙනස් කිරීම්වලට යටත්ව, අදාළ විය යුතු ය :—

(අ) එම වගන්තියේ (4) වන උපවගන්තිය, එහි අතුරු විධානය අත්හරිනු ලැබ තුබූවාක් මෙන් බල පැවැත්විය යුතු ය; තව ද

(ආ) ඒ වගන්තියේ (3) වන හා (4) වන උපවගන්ති, ඒ උප වගන්තිවල එන "17 වන වගන්තිය" යන යෙදුම වෙනුවට "11 වන වගන්තිය" යන යෙදුම ආදේශ කර තුබූවාක් මෙන් බල පැවැත්විය යුතු ය.

මේ පනත යටතේ කරනු ලබන තීන්දුව අවසානාත්මක බව.

**19.** බලය ලත් නිලධරයාගේ තීන්දුව, නැතහොත් සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයේ දී ඒ තීන්දුව වෙනුවට ඒ මණ්ඩලය විසින් අලුත් තීන්දුවක් දෙනු ලැබී නම් ඒ අලුත් තීන්දුව, අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, රිට් ආඥා පත්‍රයක් වශයෙන් හෝ අන් ලෙසකින් කිසිම අධිකරණයක දී එය විවාදයට භාජන නොකළ යුතු ය.

වන්දි ඉදිරිපත් කිරීම හා ගෙවීම.

**20.** 12 වන වගන්තිය යටතේ තීන්දුවක් දෙනු ලැබූ අවස්ථාවක, බලය ලත් නිලධරයා විසින්, ඒ තීන්දුව අනුව වන්දි හිමි තැනැත්තාට ඒ තීන්දුවෙන් ඉඩ දී ඇති වන්දි මුදල ඉදිරිපත් කළ යුතු ය; නැතහොත් සමාලෝචන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ආයාචනයක දී ඒ මණ්ඩලයේ තීරණයෙන් ඒ මුදල වෙනුවට අලුත් මුදලක් වන්දි වශයෙන් නියම කර තිබේ නම් ඒ මුදල ඔහුට ඉදිරිපත් කළ යුතු ය; ඉදිරිපත් කරන ලද මුදල ලබා ගැනීමට ඔහු කැමති වුවහොත් ඒ මුදල ඔහුට ගෙවිය යුතු ය.

වන්දි වෙනුවෙන් අත්තිකාරම් ගෙවීමට බලය ලත් නිලධරයාට ඇති බලය.

**21.** බලය ලත් නිලධරයා විසින්, මේ පනත යටතේ වන්දි සඳහා හිමිකම් පෑමක් නිශ්චය කිරීමට පෙර, ඒ වන්දි හිමි තැනැත්තා යයි තමා විසින් සලකනු ලබන තැනැත්තකුට අත්තිකාරමක් ගෙවිය හැකි අතර, එසේ ගෙවනු ලැබූ යම් මුදලක් 12 වන වගන්තිය යටතේ ඒ තැනැත්තාට තීන්දු කරනු ලබන වන්දි මුදලින් අඩු කළ යුතු ය.

වන්දි ගෙවීමේ පිළිවෙල හා ආකාරය.

**22.** මේ පනත යටතේ වන්දි මුදල් ගෙවීමේ පිළිවෙල හා ආකාරය මුදල් විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කළ යුතු ය.

## II වන කොටස

## කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු

කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු.

23. (1) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන එක් එක් ප්‍රදේශය සඳහා කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් විය යුතු ය.

(2) ඒ එක් එක් කමිටුව අවිච්ඡින්න පරම්පරාවක් සහ පොදු මුද්‍රාවක් ඇති නීතිගත සංස්ථාවක් විය යුතු අතර එහි සංස්ථා නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි විය යුතු ය.

(3) ඒ එක් එක් කමිටුවේ සාමාජිකයන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයන්, කෘෂිකර්මයේ ව්‍යාවෘත තැනැත්තන්ගේ සම්බන්ධතා නියෝජනය කරන තැනැත්තන් ලෙස අමාත්‍යවරයාට පෙනී යන හෝ පත් කරනු ලැබීම අවශ්‍ය යයි අමාත්‍යවරයා අදහස් කරන තැනැත්තන් දස දෙනෙකුට නොවැඩි විය යුතු ය.

(4) ඒ කමිටුවේ සාමාජිකයන් අතුරින් එක් තැනැත්තකු කමිටුවේ සභාපති ලෙස ද තවත් තැනැත්තකු කමිටුවේ උප සභාපති ලෙස ද අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(5) ඒ කමිටුවේ සාමාජිකයකුගේ ධුර කාලය අවුරුදු තුනක් විය යුතු ය. එහෙත් කාලය ඉකුත් වීම නිසා සිය ධුරය දැරීම අවසන් කරන සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය.

(6) කමිටුවේ යම් සාමාජිකයකු විසින් අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(7) අසනීප වීම නිසා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ අන් හේතුවක් නිසා තම ධුරයෙහි යුතුකම් ඉටු කිරීමට සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් සාමාජිකයකු වශයෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය.

(8) යම් සාමාජිකයකු ශාරීරික හෝ මානසික අබලතාවයක් නිසා තම ධුරයේ යුතුකම් ඉටු කිරීමට නොහැකි තත්ත්වයක හෝ වෙනත් හේතු නිසා එම යුතුකම් ඉටු කිරීමට නුසුදුසු තත්ත්වයක සිටින බව අමාත්‍යවරයාට ඒත්තු ගියහොත් එම සමාජිකයාගේ පත්වීම අවසාන කොට වෙනත් සාමාජිකයකු ඒ කමිටුවට පත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි ය:

එසේ වුව ද ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ අන් ලෙසකින් ධුරය අත්හරින සාමාජිකයකු වෙනුවට පත්කරනු ලබන සාමාජිකයකු, ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ධුරය අත් හැරිය හොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කොටස තුළ ධුරය දැරිය යුතු ය.

(9) තමා පැමිණ සිටින කමිටුවේ සෑම රැස්වීමක දී ම කමිටුවේ සභාපති මූලාසනය දැරිය යුතු ය. සභාපති නොපැමිණ සිටි විට කමිටු වේ උප සභාපති මූලාසනය දැරිය යුතු ය.

(10) මේ පනතේ අන් විධිවිධානවලට යටත්ව, ගණපූරණය සඳහා අවශ්‍ය ගණන නිශ්චය කිරීමේ බලය ඇතුළුව කමිටුවේ කාර්ය පරිපාටි නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලය කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවකට තිබිය යුතු ය.

කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවල කාර්යයන් හා බලතල.

24. (1) අන් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොතකා, එසේ පිහිටුවන ලද කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් වෙත පැවරී ඇති යුතුකම, එම කමිටුවේ බල ප්‍රදේශය තුළ කෘෂිකර්මය නඟා සිටුවීම, සම්බන්ධීකරණය සහ සංවර්ධනය කිරීම, බෝග වැවීම සහ සතුන් ඇති කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු සැලසුම් හා ඉලක්ක සම්පාදනය කිරීමට ආධාර වීම සහ මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ අමාත්‍යවරයා විසින් ඒ කමිටුවලට පවරන බලතල පාවිච්චි කිරීම ද විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවකට පහත සඳහන් දේ කිරීමේ බලය තිබිය යුතු ය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, තබා ගැනීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන් ලෙසකින් බැහැර කිරීම ;

(ආ) ඒ කමිටුවේ බල ප්‍රදේශය තුළ පිහිටි සියලුම කෘෂිකාර්මික ඉඩම්වල ලේඛනයක් නියමිත ආකාරයට සකස් කොට පවත්වාගෙන යාම ;

(ඇ) යම් තොරතුරක් සපයන ලෙස හා ඉඩමට හෝ කෘෂිකාර්මික කටයුත්තට සම්බන්ධ ඔප්පු හෝ අනිකුත් ලේඛන පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඒ කමිටුවේ බල ප්‍රදේශය තුළ පිහිටි ඉඩමකට යම් සම්බන්ධතාවයක් ඇති හෝ ඒ ප්‍රදේශය තුළ යම් කෘෂිකාර්මික කටයුත්තක් කර ගෙන යන යම් තැනැත්තකුට නියම කිරීම ;

(ඈ) කෘෂිකාර්මික ඉඩම්වල කාර්යක්ෂම ලෙස ගොවිතැන් කිරීම, කාර්ය සංවිධානය කිරීම, කාර්යක්ෂම ලෙස ඒ ඉඩම් පවත්වාගෙන යාම හා සංවර්ධනය සුරක්ෂිත කිරීම සඳහා සැලසුම් සකස් කොට, ඒවා මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය වරයාට ඉදිරිපත් කිරීම ;

(ඉ) කෘෂිකාර්මික ඉඩම් ඒකාබද්ධ කිරීම සඳහා සැලසුම් සකස් කොට, ඒවා නියෝග මගින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයාට ඉදිරිපත් කිරීම ;

(ඊ) අක්කරයකට අවුරුද්දකට රුපියල් හයකට වැඩි නො වන අක්කර බද්දක් සහ මේ පනත යටතේ සලස්වනු ලබන සේවයන් සඳහා තවත් යම් ගාස්තුවක් ද කෘෂිකාර්මික ඉඩම්වල අයිතිකරුවන්ගෙන් හෝ පරිහරණය කරන්නන් ගෙන් පනවා අයකර ගැනීම ;

(උ) කමිටුවේ මුදල්, එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා යුතුකම් ඉටු කිරීමේ දී සිදුවන වියදම් පියවීමට සහ නියම කරනු ලැබිය හැකි යම් කාර්යයන් සඳහා පාවිච්චි කිරීම ;

(ඌ) කමිටුව විසින් නිශ්චය කරනු ලබන යම් බැංකුවක ගිණුමක් පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම.

(3) මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු වෙත තවත් බලතල හෝ යුතුකම් පැවරීම කරනු ලැබිය හැකි ය.

(4) ඒ සෑම කමිටුවක් ම, එහි බලතල පාවිච්චි කිරීමෙහි ලා හා යුතුකම් ඉටුකිරීමෙහි ලා අමාත්‍යවරයාගේ හෝ නියම කරනු ලැබිය හැකි බලය පැවරුණු බලධරයාගේ සාමාන්‍ය විධානයට යටත් විය යුතු ය.

(5) එක් එක් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවේ ගිණුම් අමාත්‍යවරයා විසින් කලින් කල විධාන කළ හැකි ක්‍රමයකට හා ආකාරයකට පවත්වාගෙන යෑම ඒ ඒ කමිටුවේ සභාපතිගේ යුතුකම විය යුතු ය. ඒ ගිණුම් ඒවා විගණනය කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් දෙනු ලැබිය හැකි යම් විධානයකට අනුකූලව අවුරුදු පතා විගණනය කරනු ලැබිය යුතු අතර එසේ විගණනය කිරීමෙන් පසු හැකි තාක් ඉක්මනින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**අමාත්‍යවරයා සතු බලය.**

25. මේ පනතින් නැතහොත් මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් යම් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ බලයක්, යුතුකමක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කරන ලෙස, ඉටු කරන ලෙස හෝ කරන ලෙස අමාත්‍යවරයා විසින් ඒ කමිටුවකට විධාන කළ පසු, එම විධානයේ නිශ්චිතව සඳහන් කාලසීමාව තුළ එසේ කිරීම ඒ කමිටුව පැහැර හරින අවස්ථාවක දී ඒ බලය, යුතුකම හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි අතර, අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ විධිවිධාන යටතේ එසේ කරනු ලබන යම් ක්‍රියාවක් ඒ කමිටුව විසින් කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

**ගාස්තු අයකර ගැනීම.**

26. කෘෂිකාර්මික ඉඩම්වලට හෝ එහි කරගෙන යනු ලබන කටයුතුවලට අදාළව කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක කාර්යයන් ඉටුකිරීමේදී ඒ කමිටුව විසින් නිසි පරිදි දරන ලද සියලුම වියදම් ඒ ඉඩමේ අයිතිකරුගෙන් හෝ පරිහරණය කරන්නාගෙන් අය කර ගත හැකි විය යුතු අතර එසේ අයකර ගත යුතු මුදල වෙනුවෙන් ඒ ඉඩමේ පලදාව සම්බන්ධයෙන් ඒ කමිටුවට කෑප අයිතියක් තිබිය යුතු ය.

**කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.**

27. එක් එක් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය.

මුදල් ණයට ගැනීමේ බලය.

28. ඒ කමිටුවේ කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා අවශ්‍ය විය හැකි හෝ එයට වැඩදායක හෝ ආනුෂංගික විය හැකි මුදලක් හෝ මුදල්, මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙනු ලබන අමාත්‍යවරයාගේ අනුමතියට යටත්ව, ආණ්ඩුවෙන් හෝ අනුමත කරන ලද ණය දෙන ආයතනයකින් හෝ ආයතනවලින් ඒ කමිටුව විසින් ණයට ගැනීම නීත්‍යනුකූල විය යුතු ය.

සේවකයන් හෝ නියෝජිතයන් පත් කිරීම.

29. කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක බලතල පාවිච්චි කිරීම සහ යුතුකම් ඉටු කිරීම සඳහා ඒ කමිටුව විසින් යෝග්‍ය යයි සලකනු ලබන යම් සේවකයන් හෝ නියෝජිතයන් ඒ කමිටුව විසින් පත් කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

## කෘෂිකාර්මික විනිශ්චය අධිකාර

කෘෂිකාර්මික විනිශ්චය අධිකාර පිහිටුවීම සහ ඒවායේ සංයුතිය.

30. (1) මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට කෘෂිකාර්මික විනිශ්චය අධිකාර පිහිටුවීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි ප්‍රදේශ සංඛ්‍යාවක්, ඔහු විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය හැකි ආඥාවක් මගින්, මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාපනය කරනු ලැබිය හැකි ය.

(2) එක් එක් කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය අධිකරණ සේවා උපදේශක මණ්ඩලයේ නිර්දේශය පිට අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලබන අට දෙනෙකුට නො වැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර ඔවුන් අතුරින් යටත් පිරිසෙයින් එක් තැනැත්තකු යටත් පිරිසෙයින් පස් වසරක වෘත්තීය පළපුරුද්දක් ඇති නීතිඥයකු හෝ අධිනීතිඥයකු විය යුතු ය.

(3) එක් එක් විනිශ්චය අධිකාරයේ සභාපති ලෙස එක් සාමාජිකයකු ද උපසභාපති ලෙස තවත් සාමාජිකයකු ද අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(4) විනිශ්චය අධිකාරයේ සෑම සාමාජිකයකුම කලින් ඔහු ධුරය අත්හැර ගියහොත් හෝ ඔහු ඉන් ඉවත් කරනු ලැබුවහොත් මිස අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. කාලය ඉකුත් වීමෙන් විනිශ්චය අධිකාරයේ ධුරය අත්හැර යන යම් සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුසු විය යුතු ය:

එසේ වුව ද ධුරයෙන් ඉවත් කරනු ලබන හෝ අන් ලෙසකින් ධුරය අත්හරින සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු ඔහු කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ අන් ලෙසකින් ධුරය අත්හැරියහොත් හෝ මිස තමා අනුප්‍රාප්තිකයා වන්නේ යම් සාමාජිකයකුට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) එක් එක් විනිශ්චය අධිකාරයට ලේකම්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(6) එක් එක් විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක් අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයේ රැස්වීම්.

31. (1) එක් එක් කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයේ සභාපතිගේ විධානය යටතේ ලේකම් විසින් විනිශ්චය අධිකාරයේ රැස්වීම් කැඳවිය යුතු ය. එම රැස්වීමකට සභාපති සහ සාමාජිකයන් තිදෙනෙකු කැඳවනු ලැබිය යුතු ය. එම සෑම රැස්වීමකටම නීතිඥ සාමාජිකයකු ඇතුළත් විය යුතු ය. එවැනි රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(2) විනිශ්චය අධිකාරයේ සෑම රැස්වීමක දී ම විනිශ්චය අධිකාරයේ සභාපති මුලසුන දැරිය යුතු ය. විනිශ්චය අධිකාරයේ සෑම රැස්වීමකදීම සභාපති පැමිණ නොමැති අවස්ථාවල දී විනිශ්චය අධිකාරයේ උපසභාපති මුලසුන දැරිය යුතු ය. සභාපති හෝ උප සභාපති පැමිණ නොමැති අවස්ථාවල දී රැස්වීමකට කැඳවනු ලැබ සිටින විනිශ්චය අධිකාරයේ සාමාජිකයන් විසින් ඒ රැස්වීම සඳහා සාමාජිකයන් අතුරින් සභාපතිවරයකු තෝරා ගත යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ රැස්වීමක් වරින් වර කල් දැමීම හෝ අඩාලව කල් තැබීම කළ හැකි ය.

ආයාචනා කිරීමේ අයිතිය යනාදිය.

32. (1) මේ පනතේ විධිවිධාන යටතේ අහිමි කිරීමේ ආඥාවක් යම් තැනැත්තකු වෙත භාර දෙනු ලැබුවේ ද, එම තැනැත්තා විසින්, එසේ භාර දෙනු ලැබූ දින සිට දින දහ හතරක් ඇතුළත දී එම ආඥාවට අදාළ ඉඩම පිහිටි ප්‍රදේශයේ කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය වෙත ආයාචනා කළ හැකි ය.

(2) යම් කෘෂිකාර්මික ඉඩමක කාර්ය සංවිධානය හෝ ගොවිතැන් කිරීම පිළිබඳව ආරාවුලක් පවතින්නේ යැ යි අමාත්‍යවරයා හෝ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් අදහස් කරන කල්හි එම ආරාවුල පැන නැඟී ඇති ඉඩම පිහිටා තිබෙන අධිකරණ බල ප්‍රදේශයේ කෘෂිකාර්මික විනිශ්චය අධිකාරය වෙත එම ආරාවුල එම විනිශ්චය අධිකාරයේ තීරණය සඳහා යොමු කිරීම අමාත්‍යවරයා හෝ එම කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් කරනු ලැබිය හැකි ය.

(3) කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් වෙත කරනු ලබන සෑම ආයාචනයක් හෝ යොමු කිරීමක්—

(අ) ලියවිල්ලකින් විය යුතු අතර, එහි ආයාචකගේ හෝ යොමු කිරීම කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ මෙහෙය වීම පිට ද එම තැනැත්තාගේ නම සහ ලිපිනය සඳහන් විය යුතු ය;

(ආ) එම ආයාචනය වගඋත්තරකරු පිළිබඳ සඳහනකින් යුක්ත විය යුතු ය; තව ද

(ඇ) ඉඩමට හෝ ආරාවුලට ආයාචකගේ ඇති සම්බන්ධය පිළිබඳ පැහැදිලි සහ සංක්ෂිප්ත ප්‍රකාශයක් අඩංගු විය යුතු ය.

(4) සෑම ආයාචනයක් හෝ යොමු කිරීමක් විනිශ්චය අධිකාරයේ සභාපති අමතා තිබිය යුතු අතර, විනිශ්චය අධිකාර කාර්යාලයට යැවිය යුතු ය. නැතහොත් භාර දිය යුතු ය.

(5) සෑම ආයාචනයකට හෝ යොමු කිරීමකට—

(අ) එම ආයාචනය විභාග කිරීමේ දී හෝ යොමු කිරීම සලකා බැලීමේ දී කැඳවීමට අදහස් කරන සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් ; සහ

(ආ) එම ආයාචනය විභාග කිරීමේ දී හෝ එම යොමු කිරීම සලකා බැලීමේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන ලියකියවිලිවල ලැයිස්තුවක්

ඇතුළත්ව තිබිය යුතු ය.

කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් ඉදිරියේ නීති කෘත්‍යය.

33. (1) කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් වෙත ඉදිරිපත් කර ඇති සෑම ආයාචනයක් හෝ යොමු කිරීමක් විභාග කිරීම හෝ සලකා බැලීම ඒ විනිශ්චය අධිකාරයේ රැස්වීමක දී කළ යුතු ය.

(2) එක් එක් ආයාචනය විභාග කිරීම හෝ යම් යොමු කිරීමක් සලකා බැලීම සඳහා ලේකම් විසින් වේලාවක් සහ ස්ථානයක් නියම කළ යුතු අතර, ඒ පිළිබඳව විසි එක් දිනක් කල් දී එහි ආයාචක හා වගඋත්තරකරු වෙත ලියවිල්ලකින් දැන්වීමක් කළ යුතු ය.

(3) ආයාචනයක ආයාචක සහ වගඋත්තරකරු පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විධිමත් ලෙස බලය පවරනු ලැබූ නියෝජිතයකු හෝ නියෝජිතයන් මගින් ආයාචනය විභාග කරන විනිශ්චය අධිකාරයේ රැස්වීමට පැමිණ පෙනී සිටිය යුතු ය.

(4) විනිශ්චය අධිකාරය විසින් යම් ආයාචනයක් හෝ යොමු කිරීමක් විභාග කිරීමේ කාර්යයන් සඳහා විනිශ්චය අධිකාරයේ සභාපතිට හෝ ඔහු පැමිණ නොමැති විට විනිශ්චය අධිකාරයේ යම් රැස්වීමක සභාපතිව සිටින තැනැත්තාට—

(අ) සාක්ෂිකරුවන් කැඳවීමේ සහ ඔවුන්ට පැමිණ සිටින ලෙස බල කිරීමේ ;

(ආ) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස බල කිරීමේ ; සහ

(ඇ) සාක්ෂිකරුවකු ලවා යම් දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් කරවීමේ

දිසා අධිකරණයක සියලු බලතල තිබිය යුතු ය.

(5) විනිශ්චය අධිකාරය ඉදිරියේ යම් නීතිකෘත්‍යයක දී සිවිල් නඩු විධාන සංග්‍රහයේ 142 වන වගන්තිය සහ සාක්ෂි ආඥාපනතේ 132 වන වගන්තිය ඒ නීතිකෘත්‍යය සිවිල් අධිකරණයක් ඉදිරියේ කෙරෙන නීතිකෘත්‍යයක් වූවාක් මෙන් සාක්ෂිකරුවකුට ආදාළ විය යුතු ය.

(6) විනිශ්චය අධිකාරය විසින් විභාග කරනු ලබන සෑම ආයචන යක් හෝ විනිශ්චය අධිකාරය වෙත කරනු ලබන සෑම යොමු කිරී මක් සම්බන්ධයෙන් ඒ ආයාචනයට හෝ යොමු කිරීමට අදාළව විනිශ්චය අධිකාරය ඉදිරියේ පැවැත්වෙන සියලු නීතිකෘත්‍ය පිළිබඳ වාර්තාවක් ලේකම් විසින් තබා ගත යුතු ය.

**කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයන්හි තීරණ.**

34. (1) කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක රැස්වීමක දී ඒ රැස්වීමේ දී විභාග කරන ලද ආයාචනයක් හෝ යොමු කිරීමක් මත ගන්නා ලද තීරණය, ඒ ආයාචනය හෝ යොමු කිරීම සම්බන්ධයෙන් විනිශ්චය අධිකාරයේ තීරණය ලෙස සැලකිය යුතු ය.

(2) ආයාචනයක් හෝ යොමු කිරීමක් විභාග කරන විනිශ්චය අධිකාරයේ සාමාජිකයන් ආයාචනය හෝ යොමු කිරීම පිළිබඳ වූ තීරණය සම්බන්ධයෙන් එකඟ නොවන කල්හි, ඔවුන්ගෙන් බහුතර සංඛ්‍යාවගේ තීරණය ආයාචනය හෝ යොමු කිරීම පිළිබඳව විනිශ්චය අධිකාරයේ තීරණය විය යුතු අතර තම මතය සම්බන්ධයෙන් සාමාජිකයන් සමාන ලෙස බෙදී සිටින කල්හි ආයාචනය හෝ යොමු කිරීම විභාග කරන රැස්වීමේ සභාපති පක්ෂ වන තීරණය ආයාචනය හෝ යොමු කිරීම පිළිබඳව විනිශ්චය අධිකාරයේ තීරණය විය යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ සෑම තීරණයකම ඒ සඳහා හේතු අඩංගු විය යුතු ය.

(4) ආරාවුලේ විෂය වස්තුව පිහිටියේ යම් දිසා අධිකරණයක අධිකරණ බල සීමාව තුළ ද ඒ දිසා අධිකරණය වෙත ඉල්ලුම් කළ විට විනිශ්චය අධිකාරයේ සෑම තීරණයක්ම එය ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන් ක්‍රියාත්මක කළ යුතු අතර, ඒ අනුව, ඒ තීන්දු ප්‍රකාශය ක්‍රියාවෙහි යෙදවීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි විධිවිධාන අදාළ විය යුතු ය.

**කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයේ තීරණය අවසානාත්මක බව.**

35. 36 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි හැර කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක තීරණයක් අවසානාත්මක විය යුතු අතර, කිසිදු අධිකරණයක දී එය විවාදයට භාජන කරනු නොලැබිය යුතු ය.

**නීතිමය ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට ආයාචනා කිරීම.**

36. (1) කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයක් වෙත කරන ලද ආයාචනයකට හෝ යොමු කිරීමකට සම්බන්ධ පාර්ශ්වකරුවකු ඒ ආයාචනය හෝ යොමු කිරීම පිළිබඳ විනිශ්චය අධිකාරයේ තීරණය ගැන සෑහීමට පත් නොවන කල්හි ඔහු විසින් අනෙක් පාර්ශ්වකරු වගඋත්තරකරු වශයෙන් සඳහන් කර ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඒ තීරණයට විරුද්ධව නීතිමය ප්‍රශ්නයක් මත ශ්‍රේෂ්ඨාධිකරණයට ආයාචනා කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පෙත්සමක විවාද කළ යුතුව ඇති නීතිමය ප්‍රශ්නය සඳහන් විය යුතු ය. එම ප්‍රශ්නය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විනිශ්චය කරනු ලැබීම සඳහා වූ ප්‍රශ්නයක් බවට නීතිඥයකු හෝ අධිනීතිඥයකු විසින් කරන ලද සහතිකයක් ඒ පෙත්සමට අමුණා තිබිය යුතු අතර ආයාචනය කරනු ලබන්නේ විනිශ්චය අධිකාරයේ යම් තීරණයකට විරුද්ධව ද එම තීරණයේ දින සිට දින විසි එකක් ඇතුළත දී ආයාචක විසින් එහි පිටපත් තුනකින් යුක්තව එය විනිශ්චය අධිකාරයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියෙහි නිශ්චිතව සඳහන් ආකාරයෙන් සහ ඒ කාලය ඇතුළත ආයාචනා පෙත්සමක් විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, විනිශ්චය අධිකාරයේ ලේකම් විසින්—

(අ) ආයාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය කරනු ලැබුවේ යම් නීති කෘත්‍යයක දී ද ඒ නීති කෘත්‍යය පිළිබඳ ලේඛනය සමග ආයාචනා පෙත්සමේ පිටපත්වලින් එකක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවිය යුතු අතර,

(ආ) ආයාචනා පෙත්සමේ පිටපතක් සමග ආයාචනා පෙත්ස මෙහි නම් කර ඇති වගඋත්තරකරු වෙත ආයාචනය පිළිබඳ දැන්වීමක් නිකුත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කෙරෙන ආයාචනයකට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියෙහි වූ යම් නීති කෘත්‍යයක දී මුද්දර ගාස්තු අවශ්‍ය නොවිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ කෙරෙන ආයාචනයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අවසානාත්මක විය යුතු ය.

## IV වන කොටස

### කෘෂිකාර්මික සමුපකාර සමිති

**37.** (1) අමාත්‍යවරයා විසින් සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විමසා, එක් එක් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු ප්‍රදේශයෙහි එම ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම්වල ගොවීන්ගෙන් සමන්විත කෘෂිකාර්මික සමුපකාර සමිති පිහිටුවනු ලැබිය හැකි ය. ප්‍රදේශයෙහි තිබෙන ස්වකීය බිම් කට්ටිවල මුළු ප්‍රමාණය මේ පනත යටතේ නියමිත ප්‍රමාණයට වැඩි නොවන තැනැත්තන් ඒ සමිතිය විසින් සාමාජිකයන් වශයෙන් පිළිගත හැකි ය. කෘෂිකාර්මික සමුපකාර සමිති.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන කෘෂිකාර්මික සමුපකාර සමිති, පරිපාලන දිස්ත්‍රික්කය සඳහා කෘෂිකාර්මික සමුපකාර සංගමයක් ඇති කර ගනු පිණිස, ඒකාබද්ධ කරනු ලැබිය හැකි ය.

(3) මේ කොටස යටතේ පිහිටුවනු ලබන සියලු සමුපකාර සමිති සමුපකාර ආඥාපනතෙහි විධිවිධානවලින් හා ඒ යටතේ සාදන ලද නියෝගවලින් මේ පනතෙහි විධිවිධාන උල්ලංඝනය නොකෙරෙන තාක් දුරට ඒ විධිවිධානවලට හා නියෝගවලට යටත් විය යුතු ය.

(4) කෘෂිකාර්මික සමුපකාර සමිතියක් විසින් පහත සඳහන් කාර්යයන් සියල්ල හෝ ඉන් යමක් ඉටු කළ හැකි ය:—

(i) ස්වකීය සාමාජිකයන්ට අයිති ඉඩම් ප්‍රමාණවලට සමානුපාතිකව කෘෂිකාර්මික අත්තිකාරම් මුදල් ලබා ගැනීම ;

(ii) අවශ්‍ය බීජ වර්ග, රසායන පොහොර, කෘමිනාශක ද්‍රව්‍ය, ගවයන්, පොම්ප, කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ ඇතුළුව කාරක මූලධනය ගොවීන්ට සැපයීම සහ අස්වැන්න ගබඩා කිරීම හා ප්‍රවාහණය කිරීම සඳහා පහසුකම් සැලැස්වීම;

(iii) බීජ වර්ග තෝරා ගැනීම, බෝග වර්ග කිරීම, කෘෂිකාර්මික පළිබෝධ හා වල් පැළෑටි තුරන් කිරීම සහ ඇලවල් හා කාණු තැනීම ඇතුළුව යෝග්‍යතම ආකාරයෙන් ඉඩම්වල ගොවිතැන් කිරීම හා ඒ ඉඩම් ප්‍රයෝජනයට ගැනීම සංවිධානය කිරීම;

(iv) ගිවිස ගනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව සාමාජික යන් නිපදවන ද්‍රව්‍ය විකිණීම; සහ

(v) ස්වකීය සාමාජිකයන්ගේ ශුභ සිද්ධිය සඳහා සියලු පියවර ගැනීම.

(5) සමුපකාර සංවර්ධන කොමසාරිස්ගේ උපදෙස් පිට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නිලධරයකුගේ අනුපාලනය යටතේ කෘෂිකාර්මික සමුපකාර සමිතියක් විසින් ස්වකීය කටයුතු පවත්වා ගෙන යා යුතු ය. ඒ නිලධරයා කෘෂිකාර්මික සමුපකාර සමිති එකකට වැඩි ගණනක් භාරව සිටිය හැකි ය.

(6) කෘෂිකාර්මික සමුපකාර සමිතියක් සඳහා වූ සාංගමික ව්‍යවස්ථාවලිය මේ පනතෙහි විධිවිධානවලට යටත්ව අමාත්‍යවරයා විසින්, සමුපකාර සංවර්ධනය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නියම කළ හැකි ය.

කෘෂිකාර්මික සමුපකාර බදු ඉඩම් සමිති.

38. (1) කෘෂිකාර්මික සමුපකාර සමිතියක බල ප්‍රදේශය තුළ පිහිටි කෘෂිකාර්මික ඉඩම්වලින් කිසිවක් එහි එක් එක් අයිතිකරු ගෙන් බද්දට ලබා ගැනීමත් (මෙහි මින් මතු "කෘෂිකාර්මික සමුපකාර බදු ඉඩම් සමිතියක්" යනුවෙන් හඳුන්වනු ලබන) ඒ කෘෂිකාර්මික සමුපකාර සමිතියේ හවුල් පාලනය හා මෙහෙයවීම යටතේ ඒ ඉඩමෙහි ගොවිතැන් කිරීමත් මේ පනත යටතේ පිහිටු වනු ලැබූ කෘෂිකාර්මික සමුපකාර සමිතියක් විසින් කළ හැකි ය.

(2) ගෙවිය යුතු කුලිය සම්බන්ධයෙන් ඒ ඉඩම්වල අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ එකඟත්වය ලබා ගැනීමට කෘෂිකාර්මික සමුපකාර බදු ඉඩම් සමිතියක් අපොහොසත් වන අවස්ථාවක, කුලිය නිශ්චය කරන ලෙස කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටුව වෙත ඒ සමිතිය විසින් ඉල්ලුම් කළ හැකි ය. කෘෂිකාර්මික පලදාව වර්ධන කමිටුව විසින් ගනු ලබන යම් තීරණයක් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කෙරෙන ආයාචනයකට යටත් විය යුතු අතර අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(3) මේ පනත යටතේ පිහිටුවනු ලබන කෘෂිකාර්මික විනිශ්චය අධිකාරයකට ඒ ආයාචනය අමාත්‍යවරයා විසින් යොමු කරනු ලැබීම (2) වන උපවගන්තියෙහි සඳහන් කිසිවකින් නොවැළැක්විය යුතු ය.

(4) කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව විසින් අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ විට ඒ කමිටුවෙහි බල සීමාව තුළ පිහිටි යම් කෘෂිකාර්මික ඉඩමක් මේ වගන්තියෙහි විධිවිධාන යටතට අනිවාර්යයෙන් ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් අණ කළ හැකි ය.

(5) මේ වගන්තිය යටතේ කෘෂිකාර්මික සමුපකාර බදු ඉඩම් සමිතියකට බදු දෙනු ලබන ඉඩම් සඳහා නියම කර ඇති බදු මිල ගණන් කලින් කල පරිශෝධනය කළ හැකි ය.

(6) මේ වගන්තිය යටතේ එක් එක් සාමාජිකයාට වෙන් වෙන්ව බදු දෙන ලද ඉඩම්, ඒ ඉඩම්වල පවත්වා ගෙන යනු ලබන කෘෂිකාර්මික කටයුතු කෙරෙහි ඒ කෘෂිකාර්මික සමුපකාර බදු ඉඩම් සමිතියේ සාමාන්‍ය අනුපාලනයට හා පාලනයට යටත්ව, ස්වකීය සාමාජිකයන් අතර ඒ සමිතිය විසින්, (1) වන උපවගන්තියෙහි විධිවිධාන ගැන නොතකා, නැවත බෙදා වෙන් කළ හැකි ය.

(7) මේ පනත යටතේ පිහිටුවා ඇති යම් කෘෂිකාර්මික සමුපකාර සමිතියක සාමාජිකත්වය ඒ සමිතියේ සීමා තුළ පිහිටි ඉඩම් වගා කරන හෝ ඒ ප්‍රදේශය තුළ පදිංචිව ඇත්ත වශයෙන් ම ඉඩමෙහි ගොවිතැන් කිරීමේ යෙදී සිටින තැනැත්තන්හට හැකිතාක් දුරට සීමා කරනු ලැබිය යුතු ය.

**39.** කෘෂිකාර්මික ඉඩම් සංවර්ධනය කිරීම දැනට පවත්නා පෞද්ගලික වශයෙන් වූ ද ස්වාධීන වශයෙන් වූ ද ඉඩම් ක්‍රමයේ සිට සමුපකාර හෝ සාමූහික නිෂ්පාදන ක්‍රමයට සංක්‍රමණය වීම සඳහා වූ මූලික පියවරක් වශයෙන් කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුවක් විසින් සේවය කරනු ලබන යම් ප්‍රදේශයක සුළු ඉඩම් හිමියන්ගේ සමුපකාර සමිති ක්‍රමයක් පිහිටුවීම පිණිස සමුපකාර සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය.

සුළු ඉඩම් හිමියන්ගේ සේවා සමුපකාර සමිති.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

**40.** (1) 41 වන වගන්තිය යටතේ නියෝග සෑදීමේ බලය හැර තමා වෙත පැවරී ඇති සියලු බලතල හෝ ඉන් කිසිවක් සහ මේ පනත යටතේ හෝ එය යටතේ පනවනු ලැබූ නියෝග කිසිවක් මගින් හෝ යටතේ තමා විසින් ඉටු කරනු ලැබීමට නියමිත සියලු කරුණු හෝ ඉන් කිසිවක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ආඥාවක් මගින් තමා විසින් නම් කරනු ලබන බලධරයකුට අමාත්‍යවරයා විසින් නමින් හෝ නිලයෙන් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් පැවරිය හැකි ය.

අමාත්‍යවරයා විසින් බලතල පැවරිය හැකි බව.

(2) යම් කෘෂිකාර්මික ඉඩමක් පරීක්ෂා කිරීමේ, එහි කාර්ය සංවිධානය කරනු ලබන ආකාරය නිරීක්ෂණය කිරීමේ සහ මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් යටතේ සඳහන් කරනු ලබන කරුණු සම්බන්ධයෙන් අයිතිකරුට හෝ පරිහරණය කරන්නාට විධානයන් නිකුත් කිරීමේ කාර්යය

සඳහා සියලු සාධාරණ වේලාවන්හි දී ඒ ඉඩමට ඇතුළු වීමට එසේ බලය පවරනු ලැබ සිටින යම් තැනැත්තකු විසින් ස්වකීය කාර්ය මණ්ඩලයට බලය පැවරිය හැකි ය.

නියෝග සෑදීමේ බලය.

41. (1) මේ පනතේ ප්‍රතිපත්ති හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ ඵලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සෑදිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තිය මගින් පවරනු ලැබූ බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව, පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය :—

(අ) කෘෂිකාර්මික ඉඩම් ගොවිතැන් කිරීමේ ආකාරය හා ක්‍රම ;

(ආ) වැවිලි කර්මාන්ත භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අනිකුත් වගාවන් හා සත්ව පාලනය සඳහා උපයෝගී කර ගැනීම ඇතුළුව තේ, රබර් හා පොල් වැවිලි තිබෙන ඉඩම් උපයෝගී කර ගැනීම ;

(ඇ) සියලු කෘෂිකාර්මික ඉඩම් විධිමත් කිරීම, පාලනය කිරීම, අනු පාලනය කිරීම, මෙහෙයවීම, ඒවායේ කාර්ය සංවිධානය කිරීම හා ඒවා පරීක්ෂා කිරීම ;

(ඈ) නියම කරනු ලැබීමට මේ පනතින් නියමිත හෝ නියෝග සාදනු ලැබීමට නියමිත සියලු කරුණු ;

(ඉ) මේ පනතෙහි සඳහන් කරනු ලබන කරුණුවලට ආනුෂංගික වූ හෝ සම්බන්ධ වූ සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි ලා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසුව එළඹෙන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතිය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත නොකරනු ලබන යම් නියෝගයක් අනනුමතියේ දිනයේ සිට, එහෙත් එය යටතේ ඊට කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි පරිච්ඡින්න වූ ලෙස සැලකිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

42. (1) මේ පනතේ විධිවිධාන හෝ එය යටතේ පනවනු ලැබූ යම් නියෝග කඩ කරන හෝ කඩ කිරීමට තැත් කරන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ නියෝග යටතේ වරදක් කරන සෑම තැනැත්තකුම මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට හය මාසයකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ බන්ධනාගාර ගත කරනු ලැබීම හා දඩය යන දෙකටම යටත් විය යුතු ය.

43. රාජ්‍ය නිලධරයකු හෝ මේ පනතින් හෝ මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝගයකින් පත් කරන ලද, කමිටුවක හෝ විනිශ්චය අධිකාරයක යම් සාමාජිකයකු හෝ එවැනි කමිටුවක හෝ විනිශ්චය අධිකාරයක යම් නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් නියෝග යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව සිවිල් හෝ අපරාධ නඩුවක් නොපැවරිය යුතු ය.

කාරක සභා සහ විනිශ්චය අධිකාර ආදියෙහි සාමාජිකයන්ට විරුද්ධව නඩුවක් පැවරිය නොහැකි බව.

44. (1) කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදල යනුවෙන් හැඳින්විය යුතු අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

කෘෂිකාර්මික පලදා වර්ධන අරමුදල.

(2) මේ අරමුදලට,—

(අ) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් නියම කරනු ලබන සියලු දඩ මුදල් ;

(ආ) මේ පනත යටතේ හෝ අන් කිසි නීතියක් යටතේ අරමුදලට ගෙවීමට නියමිත සියලු මුදල් ;

(ඇ) ජාතික රාජ්‍ය සභාව විසින් කලින් කල අරමුදලට වෙන් කරනු ලබන සියලු මුදල් ;

(ඈ) ඒකාබද්ධ අරමුදලෙන් අරමුදලට ගෙවනු ලැබිය හැකි යම්කිසි මුදලක්

යන මේ මුදල් ගෙවිය යුතු ය.

(3) ඒ අරමුදලෙහි මුදල්, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පලදාව දියුණු කිරීම සහ සංවර්ධනය කිරීම පිණිස පාවිච්චි කරනු ලැබිය හැකි ය. අරමුදලේ පරිපාලනය පිළිබඳව අමාත්‍යාංශයේ ලේකම් වග කිව යුතු ය.

(4) අරමුදලේ ගිණුම් මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් කලින් කල නිශ්චිතව නියම කළ හැකි ක්‍රමයකට පවත්වා ගෙන යා යුතු අතර එපරිද්දෙන්ම නිශ්චිතව නියම කළ හැකි විස්තර එහි අඩංගු විය යුතු ය.

(5) අරමුදලේ එක් එක් වර්ෂය සඳහා වූ ගිණුම් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය. ඒ ගිණුම් විගණනය කිරීමෙහි ලා විගණකාධිපතිවරයාට සහාය වීමේ කාර්යය සඳහා ඔහු විසින් ඔහුගේ විධානය හා පාලනය යටතේ ක්‍රියා කළ යුතු සුදුසුකම් ලත් යම් විගණකයකුගේ හෝ විගණකයන්ගේ සේවය ලබා ගත හැකි ය.

(6) එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අමාත්‍යාංශයේ ලේකම් විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාව, අරමුදලේ ගිණුම් පිළිබඳ ප්‍රකාශය ද සමග, ජාතික රාජ්‍ය සභාව ඉදිරියේ තැබීම පිණිස යැවිය යුතු ය.

(7) අරමුදලේ මුදල් වර්ෂය එක් එක් වර්ෂයේ පළමුවන දින ආරම්භ වන දොළොස් මස් කාලය විය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙන යම් නීතියක් අභිභවා බල පැවැත්විය යුතු බව.

45. අන් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන සහ ඒ අන් ලිඛිත නීතිය අතර යම් ගැටුමක් හෝ නොගැලපීමක් ඇති වුවහොත්, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

46. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි :

" කාර්ය සංවිධානය " යන්නෙහි ව්‍යාකරණානුකූල වෙනස්වීම් සහ සජාතීය යෙදුම් හා සමග ගත් කල 2 වන හා 3 වන වගන්ති යටතේ සඳහන් සියලු කරුණු ඊට ඇතුළත් වේ ;

" කෘෂිකර්මාන්තය " යන්නට

(i) වී, සියලුම කෙත් බෝග, කුළුබඩු, කාර්මික බෝග, එළවළු, පලතුරු, මල්, තණබිම් සහ සත්වාහාර වගා කිරීම ;

(ii) කිරි පට්ටි පාලනය, සතුන් ඇති කිරීම සහ බෝ කිරීම ;

(iii) ශාක සහ එළ තවාන්

ඇතුළත් වේ.

" කෘෂිකාර්මික ඉඩම " යන්නෙන් මේ පනතෙහි දෙන ලද අර්ථය අනුව කෘෂිකර්මය සඳහා උපයෝගි කරගනු ලබන හෝ උපයෝගි කරගත හැකි ඉඩම් අදහස් වන අතර ඊට පෞද්ගලික ඉඩම්, ඉඩම් සංවර්ධන ආඥාපනත හෝ රජයේ ඉඩම් ආඥාපනත හෝ අන් යම් ප්‍රඥප්තියක් යටතේ පවරා දෙන ලද ඉඩම් ද ඇතුළත් විය යුතු ය. එහෙත් ගෙවතු ඉන් බැහැර විය යුතු ය ;

" කෘෂිකාර්මික නිෂ්පාදනය " යන්නට කෘෂිකර්මාන්තය පවත්වාගෙන යනු ලැබීමේදී නිෂ්පාදනය කෙරෙන (පණ ඇති හෝ නැති) කිසිවක් ඇතුළත් වේ ;

" කෘෂිකාර්මික බිම් කට්ටි " යන්නෙන් පොදු පාලනයක් යටතේ වූ සියලු බිම් කට්ටි හා කෘෂිකර්මාන්තය සඳහා කාර්යක්ෂම ලෙස ප්‍රයෝජනයට ගත හැකි යයි අමාත්‍යවරයා අදහස් කරන බිම් කට්ටියකට යාබද අන් කිසි ඉඩමක් ඇතුළුව කෘෂිකාර්මික කාර්යයන් සඳහා තනි ඒකකයක් වශයෙන් කාර්ය සංවිධානය කරනු ලබන ඉඩම් අදහස් වේ ;

" ගෙවත්ත " යන්නෙන් තමාගේ හෝ තම පවුලේ ප්‍රයෝජනය සඳහා එළවළු, පලතුරු හෝ සත්ව නිෂ්පාදන සපයා ගැනීම

සඳහා අයිතිකරු හෝ පරිහරණය කරන්නා විසින් සම්පූර්ණයෙන් හෝ ප්‍රධාන වශයෙන් වගා කරනු ලබන අක්කර ½ ට වැඩි නොවූ ඉඩම් කැබැල්ලක් අදහස් වේ;

"පරිහරණය කරන්නා" යන්නෙන්, තමා බදුකරු හෝ පොලීමරු උකස් හිමි වීමේ හේතුවෙන් කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගැනීමට සහ පරිහරණය කිරීමට තත් කාලයේ හිමිකම් ඇති තැනැත්තා අදහස් වන අතර, ඉඩම් සංවර්ධන ආඥා පනත සහ රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ අන්සතු කරනු ලැබූ කෘෂිකාර්මික ඉඩම් ප්‍රයෝජනයට ගන්නා වූ සහ පරිහරණය කරන්නා වූ තැනැත්තන් ඊට ඇතුළත් විය යුතු අතර 1958 අංක 1 දරන කුඹුරු පනතේ අර්ථානුකූල වූ අඳය ගොවියෙක් ද ඊට ඇතුළත් වේ;

"ප්‍රධාන වැඩ" යන්නට ඉඩම් සංවර්ධනය, ඉඩම් මට්ටම් කිරීම, පස් සහ ජල සංරක්ෂණය, ක්ෂේත්‍ර වාරිමාර්ග ඇලවල් සහ ඉදි කිරීම්, කාණු ක්‍රම සහ කර්මාන්ත ඇතුළත් වේ;

"සවිකල උපකරණ" යන්නට කෘෂිකාර්මික කාර්යයන් සඳහා අවශ්‍ය වූ යම් ගොඩනැගිලි ඒ ඉඩමට සවිකර හෝ සම්බන්ධ කර ඇත්තා වූ ඉදිකිරීම් හෝ යන්ත්‍රෝපකරණ ඇතුළත් වේ.